(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(11).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 පෙබරවාරි 22 සෙනසුරාදා**

**2025 මාර්තු 04 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් 2025.02.20 වැනි දින ඉදිරිපත් කරන ලද සන්ධාන පත්‍රය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 දෙසැම්බර් 22 දිනැති අංක 2415/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 මාර්තු 14 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

126/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 දින සිට 2024.09.21 දින දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය මුදල කොපමණද;

(ii) 2024.09.21 දින සිට මේ දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය මුදල කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් ණය මුදල ලබා ගන්නා ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය මුදල් ලබා ගන්නා ලද අරමුණ කවරේද;

(v) එම ණය මුදල් සඳහා අය කරනු ලබන පොළී ප්‍රතිශතය කවරේද;

(vi) එම ණය වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතු දිනය සහ ගෙවා අවසන් වන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

155/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සුළං විදුලි බලය සහ සූර්ය විදුලි බලය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දියාවේ අදානි සමාගම හෝ එහි උප සමාගමක් සමඟ ගිවිසුම්වලට එළැඹ තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුමේ මූලික අරමුණු කවරේද;

(iv) තරගකාරී ටෙන්ඩර් කැඳවීමකින් තොරව ඉහත සමාගමට ශ්‍රී ලංකාව තුළ විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලද පදනම කවරේද;

(v) ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව "රජයක් සහ රජයක් අතර" (Government to Government) යන අර්ථයට ඉහත සඳහන් සමාගම අයත් නොවන බව පිළිගන්නේද;

(vi) එම ගිවිසුම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

190/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි ගාස්තු සංශෝධනය කරන බව රජය විසින් විවිධ අවස්ථාවලදී ප්‍රකාශයට පත් කර තිබෙන බව දන්නේද;

(ii) අවසන් වරට විදුලි ගාස්තු සංශෝධනය කරන ලද දිනය කවරේද;

(iii) ඉදිරියේදී විදුලි ගාස්තු සංශෝධනය කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) විදුලි ගාස්තු සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් දීර්ඝ කාලයක් ගනු ලබන බවට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කරනු ලබන ප්‍රකාශය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(v) විදුලි ගාස්තු තවදුරටත් සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

293/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අධික වැසි නිසා ඇති වූ ජල ගැලීම් හේතුවෙන් කල්මුනේ, අෂ්රෆ් අනුස්මරණ රෝහලේ ශල්‍යාගාර, දැඩි සත්කාර ඒකක, නේවාසික වාට්ටු, බාහිර රෝගී අංශය, සායන, ඖෂධ ගබඩා ඇතුළු රෝහල් පරිශ්‍රය සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වූ බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලේ කටයුතු අකර්මණ්‍ය වූ බවත්;

(iii) රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන රෝහල් පරිශ්‍ර වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යා යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම රෝහල ජලයෙන් යට වීම නිසා සිදු වූ හානිය තක්සේරු කර තිබේද;

(ii) එසේ නම්, එම හානිය කොපමණද;

(iii) එම හානිය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

(iv) මින් ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවීමට සහ රෝහල් පරිශ්‍රය වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

302/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සහ පෞද්ගලික අංශයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් වන ආකාරයට පසුගිය වසර පහ තුළ ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර තුන තුළ අ.පො.ස. (සා/පෙ) සහ අ.පො.ස. (උ/පෙ) විභාග සඳහා පෙනී සිටි සහ සමත් වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව සහ පෞද්ගලිකව විභාගයට පෙනී සිටි තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් සමත්ව රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට වෙන් වෙන් වශයෙන් දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ එහෙත් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට වරම් නොලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ඇස්තමේන්තුගත වියදම වෙන් වෙන් වශයෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(iv) පසුගිය වසර පහ තුළ අධ්‍යාපනය සඳහා වන මුළු වෙන්කිරීම් සහ එය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මාර්තු 15 සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

255/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, නුගදූව, "වලහන්දූව වත්ත" ඉඩම කැබලි කර විවිධ ව්‍යාපෘති සඳහා ලබා දීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එක් එක් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හා අපේක්ෂිත ප්‍රතිලාභ හඳුනාගෙන තිබේද;

(v) ඒ අනුව, අත්‍යවශ්‍ය ව්‍යාපෘති කවරේද;

(vi) ඒ අතරින් ඇතැම් ව්‍යාපෘති මේ වනවිට අතරමග නතර වී තිබේ නම්, එම ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමේ හැකියාවක් තිබේද;

(vii) නොඑසේ නම්, එම ව්‍යාපෘති වෙනුවෙන් දැරීමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

275/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අයි.ඩී.එච්. සිට කොළොන්නාව මංසන්ධිය දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැඩපිළිවෙළක් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

(iii) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

382/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව සහ මේ වනවිට එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු සඳහා නව නිලධාරීන් බඳවා ගන්නේද;

(iii) මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව සහ වැඩ ආවරණය කරනු ලබන සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට විශ්‍රාම ගොස් ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ සමෘද්ධි කළමනාකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහ සමෘද්ධි කළමනාකරුවන්ගේ කාර්යභාරය එක සමාන වන්නේද;

(ii) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට සහ සමෘද්ධි කළමනාකරුවන්ට උසස්වීමේ ක්‍රමවේදයක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට පිහිටුවා ඇති සමෘද්ධි බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධයෙන් සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

429/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මූතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ස්ථාපිත කර වසර කිහිපයක් ගත වී තිබුණද, මේ වනතෙක් තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කර නොමැති බවත්;

(ii) කින්නියා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කිරීමේ යෝජනාව පළාත් පාලන කොමිෂන් සභාව විසින් අනුමත කර තිබුණද, එම යෝජනාව මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තෝප්පූර් උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කිරීමට සහ කින්නියා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් බවට පත් කිරීමට ඇති බාධාවන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සමහර ග්‍රාම නිලධාරි වසම්වල පවුල් 1000කට අධික සංඛ්‍යාවක් ජීවත් වන අතර සමහර ග්‍රාම නිලධාරි වසම්වල පවුල් 100ක් පමණක් ජීවත් වන බව දන්නේද;

(ii) එසේ නම්, මෙම අසමතුලිත තත්ත්වය යථාවත් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

437/2025

ගරු දිනිඳු සමන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල සහ මොනරාගල යන දිස්ත්‍රික්ක දෙකට මායිම්ව සිංහලයාගම, උනකන්ද හා අන්නාසිගල ප්‍රදේශ ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබන විදුලි ව්‍යාපෘතිය සඳහා ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ කවුරුන් විසින්ද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන් විසින්ද;

(iii) එම අනුමතිය ලබා දෙන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අදාළ රේඛීය අමාත්‍යාංශය සහ අදාළ වෙනත් ආයතනවලින් නිසි අවසරය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, අවසරය ලබා ගන්නා ලද දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) ඊට අදාළ ලේඛනවල පිටපත් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මාර්තු 17 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

483/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති මුස්ලිම් දේවස්ථානවල ඉමාම් හා මුඅද්දීන් යන තනතුරු පවතින බව දන්නේද;

(ii) එම තනතුරුවල සේවය කරනු ලබන සේවකයන් සඳහා ගෙවිය යුතු අවම වැටුප සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු සටහනක් නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඉමාම් හා මුඅද්දීන් යන තනතුරුවල සේවය කරනු ලබන සේවකයන් සඳහා ගෙවිය යුතු අවම වැටුප සම්බන්ධයෙන් නිගමනයකට එළැඹ සෑම පල්ලියකම සමාන වැටුපක් ගෙවිය යුතු බවට තීරණයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

493/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලවලින් උපාධිය හදාරා අවසන් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට දේශීය ආයුර්වේද රෝහල්වල ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මින්නේරිය ආයුර්වේද රෝහලේ භෞත චිකිත්සක ඒකකයක් පවතින බව දන්නේද;

(ii) එම ඒකකය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සිදු කරනු ලැබුවේ කවුරුන්ද;

(iii) එම කොන්ත්‍රාත්තුවේ වංචාවක් සිදු වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරනු ලැබුවේද;

(v) එම විමර්ශනයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

494/2025

ගරු රුවන් මාපලගම මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළමු පාර්ලිමේන්තුවේ සිට මේ දක්වා එක් එක් පාර්ලිමේන්තුවේ සිටි අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව, ලබා දී තිබූ වාහන සංඛ්‍යාව සහ ගෙවන ලද අනෙකුත් දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නවවැනි පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

504/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'තේ ශක්ති' අරමුදල පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) එම අරමුදලේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අරමුදලේ මේ වනවිට ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදල් යොදා ගනිමින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

510/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සණස සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් වන්නේද;

(ii) සණස බැංකුව මඟින් විශ්‍රාමික හමුදා නිලධාරින්ට "උත්තමාචාර" නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදී තිබේද;

(iii) ඒ යටතේ මේ වනවිට ණය නිකුත් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මුළු ණය මුදල කොපමණද;

(iv) වර්ෂ 2020 සිට 2024 දක්වා ණය නිකුත් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මුළු ණය මුදල කොපමණද;

(v) ණය ලබාදීමේදී සැලකිල්ලට ගනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රතිශතය කොපමණද;

(vi) ණය ආපසු ගෙවීමේ අවම හා උපරිම කාල සීමාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කොවිඩ්-19 වසංගත කාලයේදී ණය අය කර ගැනීමේ කාල සීමාව දීර්ඝ කිරීමෙන් ණය මුදලට වඩා වැඩි මුදලක් පොළිය ලෙස ගෙවීමට සිදු වී ඇති බව දන්නේද;

(ii) එම දීර්ඝ කිරීම, බැංකුවේ අභිමතය පරිදි සිදු කර ඇති බව දන්නේද;

(iii) බැංකුවේ අභිමතය පරිදි එවැනි දීර්ඝ කිරීමක් සිදු කළ හැකිද;

(iv) ඒ මඟින් අගතියට පත් වී ඇති පුද්ගලයන්ට සාධාරණය ඉටු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මාර්තු 18 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

495/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිහින්තලේ, ගොවිජන සේවා බලප්‍රදේශයේ, සීමාසහිත ජනතා ලංකා මිරිස් අලෙවි සමාගම පිහිටුවා තිබෙන බව දන්නේද;

(ii) 2001 වර්ෂයේදී මිහින්තලේ ගොවිජන සේවා බැංකුව මඟින් එම සමාගමට රු. 1,275,000/-ක ණය මුදලක් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ණය මුදල ලබා දීමේ පදනම කවරේද;

(iv) එම ණය මුදල නැවත අයකර ගන්නේද;

(v) එසේ නම්, අයකර ගැනීමේ පදනම කවරේද;

(vi) එම ණය මුදල සඳහා අයකර ගතයුතු රු. 1,975,233/-ක පොළී මුදල අයකර නොගැනීමට තීරණය කර තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

496/2025

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ විකාශය වන ලාංකීය රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, රජයේ රූපවාහිනී නාලිකා හා පෞද්ගලික රූපවාහිනී නාලිකා ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ හා පෞද්ගලික රූපවාහිනී නාලිකා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජනමාධ්‍ය සඳහා ආචාර ධර්ම පද්ධතියක් පැවතිය යුතු බව පිළිගන්නේද;

(ii) එම ආචාර ධර්ම පද්ධතිය, ශ්‍රී ලාංකීය රූපවාහිනී නාලිකා සම්බන්ධයෙන් බලපැවැත්වෙන ආකාරය කෙසේද;

(iii) රූපවාහිනී නාලිකාවල මේ වනවිට විකාශය කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති ආකාරය කෙසේද;

(iv) එම වැඩසටහන් සම්බන්ධයෙන් විමර්ශනාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

498/2025

ගරු අනුරාධ ජයරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී, වන සතුන් විසින් සිදු කරන ලද වගා හානි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ හේතුවෙන් සිදු වූ ආර්ථික අලාභය කොපමණද;

(iii) වන සතුන් විසින් සිදු කරනු ලබන වගා හානිය අවම කර ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගොවීන් වෙත නිකුත් කර ඇති ගිනි අවි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිනි අවි සඳහා භාවිතා කරනු ලබන පතරොමක මිල රු. 450/-ක් වන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ගොවීන් දැඩි අපහසුතාවයට පත් වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

502/2025

ගරු නන්ද බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරු හා විදුහල්පති සේවාවල වැටුප් විෂමතාවයක් පවතින බව පිළිගන්නේද;

(ii) එය විසඳීම සඳහා ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) ගුරු සේවා ව්‍යවස්ථාව අනුව උසස්වීම් සඳහා මොඩියුල අවශ්‍යතා සපුරාගත යුතු බව දන්නේද;

(iv) මොඩියුල අවශ්‍යතා සම්පූර්ණ කරගත නොහැකි වීම හේතුවෙන් උසස්වීම් අහිමි වීම, වැටුප් වර්ධක නොලැබීම හා සේවය ස්ථිර කිරීම ප්‍රමාද වීම ආදී ගැටලු පැන නැඟී ඇති බව දන්නේද;

(v) එම ගැටලු විසඳීම සඳහා ඇති වැඩපිළිවෙළ කවරේද;

(vi) ඒවා විසඳන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සේවා ව්‍යවස්ථානුකූලව සීමිත හා විවෘත බඳවා ගැනීම් කාල රාමු දෙකකදී සිදු කිරීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨත්වය සම්බන්ධයෙන් ගැටලු පැන නැඟී ඇති බව දන්නේද;

(ii) එම ගැටලු විසඳීමට බාධාවන් තිබේද;

(iii) එම ගැටලු විසඳීම සඳහා ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ස්ථානගත කිරීම විධිමත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

505/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ ජනතාවට පිරිසිදු පානීය ජලය නොලැබෙන බව දන්නේද;

(ii) 1992 වර්ෂයෙන් පසුව රජය සහ වැවිලි මානව සංවර්ධන භාරය (TRUST) විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතුයාය තුළ ක්‍රියාත්මක කරන ලද පානීය ජල ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල සහ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, පූනාගල LLG, කෙප්කඩේ නව නිවාස සංකීර්ණයේ ක්‍රියාත්මක කරන ලද ජල ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර නොමැති බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මේ වනවිට එම මුදල සම්පූර්ණයෙන්ම නිදහස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මාර්තු 19 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

506/2025

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරන ලද ආයතනයක්ද;

(ii) එහි කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පදනම සතු වත්කම් කවරේද;

(iv) වර්ෂ 2020 සිට 2024 දක්වා එම පදනමට අයවැය මඟින් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් කාල සීමාව තුළදී එම පදනම විගණනයට ලක් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

507/2025

ගරු දිනේෂ් හේමන්ත මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති විදුලි අලිවැට ආරක්ෂා කිරීම සඳහා බඳවාගෙන ඇති පුහුණු අලිවැට සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට සේවයේ ස්ථිර කර ඇති පුහුණු අලිවැට සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනතෙක් සේවයේ ස්ථිර කර නොමැති පුහුණු අලිවැට සහායකයන්ගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් නීතිමය බාධාවක් තිබේද;

(iv) නොඑසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(v) සේවය ස්ථිර කර නොමැති පුහුණු අලිවැට සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

511/2025

ගරු සුජීව දිසානායක මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ ක්‍රීඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ ක්‍රීඩා සංකීර්ණයක් පිහිටුවා තිබේද;

(iii) එසේ නම්, එය ස්ථාපිත කර ඇති ස්ථානය කවරේද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණය පළමුව ඉදිකිරීමට යෝජිතව තිබූ ස්ථානය කවරේද;

(v) එය වෙනත් ස්ථානයක ඉදිකිරීමට කටයුතු කරනු ලැබුවේද;

(vi) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම් සැපයීමට නියමිතව තිබූ ක්‍රීඩා කවරේද;

(ii) එම ක්‍රීඩා සංකීර්ණයේ මේ වනවිට පහසුකම් සපයා ඇති ක්‍රීඩා කවරේද;

(iii) එම ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදල කොපමණද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණය සම්පූර්ණයෙන්ම ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

514/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රැඳවුම්භාරයේ සිටින දේශපාලන සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දේශපාලන සිරකරුවා රඳවාගෙන සිටින කාලය, එරෙහිව ඇති චෝදනා, රඳවා ගැනීමට භාවිතා කර ඇති පනත වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම සඳහා ඇති සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

517/2025

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට ජාතික පාසල් ලෙස නම් කරන ලද පාසල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ජාතික පාසලේ නාම පුවරුව හා ප්‍රධාන පිවිසුම් දොරටුව සැකසීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම පාසල් පාලනය කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය මඟින්ද; නොඑසේ නම්, අදාළ පළාත් සභාව මඟින්ද;

(iv) ඒ අනුව, මේ වනවිට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

(vi) එම ජාතික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කර ඒවා රේඛීය අමාත්‍යාංශය යටතට ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මාර්තු 20 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු මුළු රජයේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ ආරක්ෂක සේවා සපයනු ලබන ආරක්ෂක සමාගම්වල නම් කවරේද;

(iii) ඒ අතරින් රජයේ සමාගම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් රජයේ ආයතනවල ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම්වලට ගෙවන ලද මුදල එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ ආයතනවලට ආරක්ෂාව සැපයීමට අදාළ කොන්ත්‍රාත් ලබා ගැනීමේදී වංචනික ක්‍රියා සිදු වන බව දන්නේද;

(ii) එසේ නම්, රජයේ ආයතනවලට ආරක්ෂක සේවා සැපයීම, රජය සතු ආරක්ෂක සමාගම්වලට ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

63/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලෝකයේ බොහෝ රටවල ආර්ථික කටයුතු ඇතුළු විවිධ කටයුතු සඳහා මේ වනවිට ඩිජිටල් තාක්ෂණය භාවිතා කරන බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ රජයේ ආයතන තුළ සිදුවන විවිධ දූෂණ හා වංචා වළක්වා ගැනීම සඳහා එම ආයතන තුළ ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

75/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි-බටහිර වවුනතිවු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පනෙයියරුප්පාන්, පන්චේනෙයි වාදක්කල්මඩු, පාවට්කොඩිච්චේනෙයි, උන්නිච්චෙයි, නෙඩියමඩු යන ප්‍රදේශ සඳහා මේ වනතෙක් පානීය ජල පහසුකම් ලබා දී නොමැති බව දන්නේද;

(ii) උන්නිච්චෙයි සිට වෙනත් බොහෝ ස්ථාන සඳහා පානීය ජලය සපයනු ලැබුවද මේ වනතෙක් උන්නිච්චෙයි ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලැබී නොමැති බව දන්නේද;

(iii) ඉහත ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම ප්‍රදේශ සඳහා පානීය ජල පහසුකම් ලබා දෙන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

211/2024

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවකයන් සංඛ්‍යාව සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අවශ්‍ය සම්පත් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

393/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති අරමුදල කාර්යාලය ''ලේක් හවුස්'' ගොඩනැගිල්ලේ 3 වන මහලේ පිහිටුවා ඇති බව දන්නේද;

(ii) මේ වනවිට එම කාර්යාලය ඉහත ගොඩනැගිල්ලෙන් ඉවත් කර වෙනත් ගොඩනැගිල්ලක ස්ථාන ගත කර තිබේද;

(iii) එසේ නම්, එම කාර්යාලය ස්ථාපිත කර ඇත්තේ රජයේ ගොඩනැගිල්ලකද; නොඑසේ නම්, පෞද්ගලික ගොඩනැගිල්ලකද;

(iv) එම කාර්යාලය මුලින් තිබූ ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා දරන ලද මාසික වියදම කොපමණද;

(v) එම කාර්යාලය වර්තමානයේ පවත්වාගෙන යනු ලබන ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා කුලිය සහ අනෙකුත් පහසුකම් වශයෙන් දරන මාසික වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මාර්තු 21 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

127/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ දී පැවති ජනාධිපතිවරණයෙන් පසුව මේ දක්වා මුද්‍රණය කරන ලද නෝට්ටු හා කාසිවල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් කොපමණද;

(ii) එම නෝට්ටු හා කාසි මුද්‍රණය කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) මුද්‍රණය කරන ලද නෝට්ටු සහ කාසි වර්ග සහ එම එක් එක් නෝට්ටු හා කාසි වර්ගයෙන් මුද්‍රණය කරන ලද වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒවා මුද්‍රණය කිරීමට හේතු කවරේද;

(v) එම නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(vi) එම නෝට්ටු හා කාසි භාවිතා කර ඇති අරමුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, එම නෝට්ටු හා කාසිවල වටිනාකම කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජය සතු සීනි සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2022 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සීනි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජය සතු සීනි කර්මාන්තශාලාවල මේ වනවිට විකුණා ගත නොහැකිව එක්රැස් වී ඇති සීනි ප්‍රමාණය සහ එතනෝල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

221/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ආරක්ෂිතව ගර්භණීභාවය අවසන් කිරීම" සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ඉදිරිපත් කරන ලද පොරොන්දුව ඉටු කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සම්බන්ධ නව නීති කඩිනමින් සම්පාදනය කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

294/2024

ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිරතුරුවම ගංවතුර ගැලීමේ අවදානම සහිත ගංගා සහ ඇළ දොළ කවරේද;

(ii) ඒවායේ ගංවතුර පාලනය කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති දේශීය හා විදේශීය ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා භාවිතා කර ඇති දේශීය අරමුදල් ප්‍රමාණය සහ විදේශීය අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ඇති ආයතන කවරේද;

(v) ඉහත ව්‍යාපෘති අතර විවිධ බාධා හේතුවෙන් අසාර්ථක වී ඇති ව්‍යාපෘති තිබේද;

(vi) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

305/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව සහ එක් එක් පීඨයේ සිටින සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ විශ්වවිද්‍යාලයක එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(v) එක් එක් පෞද්ගලික විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එක් පෞද්ගලික විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු සඳහා වැය වන මුළු පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණ ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ සිටින මහාචාර්යවරුන් සංඛ්‍යාව සහ මහාචාර්යවරුන්ගේ මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රජයේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය කොපමණද;

(iii) ඉහත එක් එක් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු සඳහා වැයවන මුළු පිරිවැය කොපමණද;

(iv) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම කොපමණද;

(v) ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ඉහත එක් එක් විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය කවරේද;

යන්නත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?